www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*සසප/ලෝසවෙඅ ගිම්හාන පාසල 2005*

# පලමු වැනි දේශනය: රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු

*තුන්වන කොටස*

**Lecture one: The Russian Revolution and the unresolved historical problems of the 20th century**
**Part 3**

**ඩේවිඩ් නෝත් විසිනි**
**2005 අගෝස්තු 31**

*2005 අගෝස්තු මස 14 වැනි දා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ "රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු" යන දේශනයේ තෙවන කොටස යි මේ. මේ දේශනය කොටස් හතරකින් පල කෙරේ. මෙය පාසැලෙහි පැවැත්වුනු පලමුවන දේශනය යි.*

## 1989 දෘෂ්ටිවාදාත්මක පල විපාක

1930 ගනන්වල ස්ටැලින්වාදී සහ ෆැසිස්ට්වාදී ප්‍රතිගාමී රැල්ලට දේශපාලනික යටත් වීම පැහැදිලි කරමින් ට්‍රොට්ස්කි, මෙසේ නිරීක්ෂනය කලේ යඃ බලය, යටත්කර ගන්නවා පමනක් නොව ඒත්තුගැන්වීම ද කරයි. බොහෝ රැඩිකලුන්ට ද, වමට නැඹුරු බුද්ධිමතුන්ට ද, පරිපූර්න අනපේක්ෂිත පුදුමයක් වූ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ හදිසි බිඳවැටීම කරන ලද අතර බර්ලින් තාප්පය කැබලි වී යාමත් සමග ආරම්භ වූ අධිරාජ්‍යවාදයේ හා ධනවාදයේ විජයග්‍රාහී ප්‍රහාරය හමුවේ ඔවුන් න්‍යායිකව සහ දේශපාලනිකව පමනක් නොව සදාචාරාත්මකව ද නිරායුධ කර දැමී ය. සුලු ධනපති වාම දේශපාලනයේ නන්වන් පැහැ ගත් ප්‍රභේද රාශිය, නැගෙනහිර යුරෝපය තුල නිලධාරි තන්ත්‍රයන් හදිසියේ ම අතුරුදහන් වීමෙන් නන්නත්තාර වී දැඩි අපේක්ෂා භංගත්වයට පත් විය. දේශපාලනික ෂෙල් වෙඩි හඬින් මානසික කම්පනයකට පත් වූ සුලුධනපති උගත්තු; නිලධාරි තන්ත්‍රයන්ගේ අභාවය විසින් නියෝජනය කෙරෙන්නේ මාක්ස්වාදයේ අසාර්ථකත්වය බව යයි නිවේදනය කලහ. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය (සෝ.ස.ස.සං.) බිඳ විසිරවීම මගින් මාක්ස්වාදය අපකීර්තියට පත්ව ඇතැයි ඔවුන් කරන ප්‍රකාශ තුල බියගුලුකම සමග ම සැලකිය යුතු ප්‍රමානයක වංචනිකත්වයක් ද තිබේ.

නිදසුනක් ලෙස මහාචාර්ය බ්‍රයන් ටර්නර් ලියූ පරිදි "අන් සියල්ලටමත් වඩා මාක්ස්වාදය, නැගෙනහිර යුරෝපයේ හා සෝවියට් සංගමයෙහි කොමියුනිස්ට්වාදයේ බිඳ වැටීම අවම වසයෙන් හෝ පූර්වාපේක්ෂා කිරීම ට අසමත් වීම නිසා මාක්ස්වාදී න්‍යායේ අධිකාරය බරපතල අභියෝගයකට ලක්ව ඇත."[14] එවන් ප්‍රකාශන හුදු මුග්ධත්වය ලෙස පමනක් විස්තර කල නොහැක. මෙය හා මීට සමාන ප්‍රකාශන වාම උගතුන් ලියූ නිලධරයේ පිලිවෙත් අවසානයේ දී සෝවියට් සංගමය බිඳ වැටීමට තුඩුදෙනු ඇතැයි අනතුරු ඇඟවූ ස්ටැලින්වාදී තන්ත්‍රයේ ස්වභාවය පිලිබඳ ට්‍රොට්ස්කිවාදී විශ්ලේෂනය ගැන උගතුන් මුලුමනින්ම නොදැන සිටියා නො වේ.

ඔවුන් ස්ටැලින්වාදයේ ව්‍යසනකාරී පරාවක්‍රය පෙර දැක කල ප්‍රකාශනයන් අප්‍රමාන සංඛ්‍යාවක් ජාත්‍යන්තර කමිටුවට සම්පාදනය කල හැකි ය. සෝ.ස.ස.සං. බිඳ වැටීමට පෙරාතුව සුලුධනපති රැඩිකලුන් විසින් එවන් අනතුරු ඇඟවීම්, සලකනු ලැබුවේ කන්ඩායමික උමතුවකට අඩු නොවන දෙයක් ලෙස ය. සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසුව, "සැබවින්ම පැවති සමාජවාදයේ" අසාර්ථකත්වය ගැන මාක්ස්වාදයට බැනවැදීම තමන්ගේ ම දෘෂ්ටි ආස්ථානයන් විවේචනාත්මකව පරීක්ෂා කර ගැනීමට වඩා පහසු බව ඔවුහු වටහාගත්හ. කෝපාවිෂ්ඨ වූ ද බලාපොරොත්තු සුන් වූ ද ඔවුහු සමාජවාදය කෙරෙහි තමන්ට ම පෙර පැවති දේශපාලන, බුද්ධිමය හා ආවේගශීලී කැපවීම දෙස දැන් බලන්නේ තමන් ගැඹුරින්ම පසුතැවෙන පාඩුදායක ආයෝජනයක් සේ සලකමිනි. ඔවුන්ගේ දෘෂ්ටි ආස්ථානය, දශක ගනනාවක් තිස්සේ ස්ටැලින්වාදයේ ක්ෂමාලාපකයෙක් වූද, බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ දිගුකාලීන සාමාජිකයෙක් වූද, එරික් හොබ්ස්බෝම් විසින් සාරාංශ

ගත කොට තිබේ. ඔහු සිය චරිතාපදානයෙහි මෙසේ ලියා ඇත.

"කොමියුනිස්ට්වාදය දැන් මියගොස් ය: ඔක්තෝබර් විප්ලව සෝ.ස.ස.සං. හා එම ආකෘතිය මත ගොඩනැංවූ දරුවන් ලෙස අප උද්යෝගිමත් කලා වූ, රාජ්‍ය හා සමාජ බොහෝමයක්, ද්‍රව්‍යමය හා සදාචාරාත්මකව විනාශභාග් වූ භූමි භාගයක් ඉතිරි කර තබමින් සම්පූර්නයෙන් කඩා වැටී ඇත. පැහැදිලි විය යුතු කරුන නම් එහි අසාර්ථකත්වය, එහි මුල සිටම මෙම ව්‍යවසාය තුල නිදන්ගතව තුබූ බව යි."[15]

ඔක්තෝබර් විප්ලවය විනාශයට නියමිතව තිබූ ව්‍යවසායක් ය යන හොබ්ස්බෝම්ගේ ප්‍රකාශයවනාහී සමාජවාදයේ නිර්ලජ්ජිත දක්ෂිනාංශික විරුද්ධවාදීන්ගේ තර්කයන්ට යටත් වීමකි. ධනේශ්වර ප්‍රතිගාමිත්වයේ දෘෂ්ටිවාදීන්, සෝසසසං බිඳවැටීම වනාහී සමාජවාදය උමතු මනෝරාජික සිහිනයක් බවට නොබිඳියහැකි නිදසුනක් වන බව තරයේ කියා සිටිති.

රොබට් කොන්ක්වෙස්ට් "විනාශභාග් කරන ලද ශතවර්ෂයක් පිලිබඳ පරිකල්පනයෝ" නම් වූ සිය කෘතිය තුල දී "මහපොලොව මත මනෝරාජ්‍යයක් ගොඩනැගිය හැකි ය යන ආදිකාලීන අදහස" ද "සියලු මානව ගැටලුවලට සර්ව-විමුක්තිදායී යුග විසඳුම් ඉදිරිපත් කිරීම" හෙලා දකියි.[16] පෝලන්ත ඇමරිකානු ඉතිහාසඥ ඇන්ඩ්‍රේජ් වැලිකි ප්‍රකාශකොට ඇත්තේ " ලෝකය පුරා කොමියුනිස්ට්වාදයේ ඉරනම ඇඟවුම් කරන්නේ එම දෘෂ්ටිය ප්‍රවේනියෙන්ම අතාත්වික වූ බවත්, එබැවින් එය ක්‍රියාවට නැගීම සඳහා යොදන ලද ඉමහත් ශක්තිය නාස්ති වී යාමට නියමිතව තිබුනු" බවත් ය.[17] මෑතක දී අභාවයට පත් වූ මාර්ටින් මාලියා නම් ඇමරිකානු ඉතිහාසඥයා 1994 දී ලිවූ "සෝවියට් ඛේදාන්තය" නම් කෘතිය තුල මෙම තේමාව විස්තාරනය කරයි. "ඒකාග්‍රිත සමාජවාදය අසාර්ථක වූයේ එය පලමුවරට රුසියාව නම් ලද වැරදි තැනක දී අත්හදා බැලීම නිසා නොව සමාජවාදී අදහසේම හේතුවෙනි. මෙම අසාර්ථකත්වයට හේතුව සමාජවාදය ධනවාදී නොවන පූර්න සමාජවාදය ලෙස ආවේනිකව ම ඉටු කල නොහැකි දෙයක් වීම යි."

සීතල යුද්ධයේ ප්‍රතිමාක්ස්වාදී ඉතිහාසඥයින්ගේ පීඨාධිපති, හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉතිහාසඥ රිචඩ් පයිප්ස් විසින් රචිත කෘතියක් තුල සමාජවාදය " ආවේනිකවම නොකලහැකි දෙයක්" වූයේ මන්ද යන්නට පැහැදිලි කිරීමක් සොයාගෙන තිබේ. 'දේපල හා නිදහස' නම් වූ පොතක ඔහු සිය දේපල න්‍යාය සඳහා ප්‍රගාඪ සත්ව විද්‍යාත්මක පදනමක් ගොඩනගයි:

"නීතිමය හා අධ්‍යාපන හික්මවීමක් අභන්නේ නැති, මානව ස්වභාවයේ එක් ස්ථිර සත්‍යයක් වන්නේ තෘෂ්නාව යි.... ශිෂ්ඨාචාරයේ සෑම මට්ටමකදී ම තිරිසන් සතුන්, දරුවන් මෙන්ම වැඩිහිටියන් අතර ද සාර්වත්‍රික වන තෘෂ්නාව, සියලු ජීවීන්ට පොදු වන නිසා එය සදාචාර දේශනාවන්ට ඔබින මාතෘකාවක් නො වේ. ඉතාමත්ම ප්‍රාථමික මට්ටමේ දී එය වනාහී පැවැත්ම සඳහා වන ඉවෙහි ප්‍රකාශනය යි. එහෙත් එය ඉන් ඔබ්බට කාර්ය සාධනය හා තෘෂ්නාව ස්වයංසාධනයේ මාධ්‍යයන් වන නිසා මානව පෞරුෂයේ ප්‍රාථමික ගති ලක්ෂනයක් අඩංගු කර ගනියි. ස්වාත්ම තෘප්තිය නිදහසේ සාරය වන නිසා, දේපල ද එය විසින් ඇති කරනු ලබන අසමානතාව ද බලහත්කාරයෙන් උගුලා දමනු ලැබූ කල්හී විමුක්තිය ද සරුව වැඩී ඒම වලකී."[19]

පයිප්ස්ගේ දේපල පිලිබඳ න්‍යාය එයට සුදුසු සුපරීක්ෂ භාවයෙන් යුක්තව විභාගකිරීමට ස්ථානය මෙය නො වේ. දේපල ආකෘතීන් මෙන්ම ඒවා සමාජ හා නීතිමය සංකල්පගත වීම ද ඓතිහාසිකව විකාශනය වූවක් බව පෙන්වාදීමට මට ඉඩ දෙන්න. දේපල පෞද්ගලික අයිතිය සමග සුවිශේෂව අනන්‍යකරගැනීම දිවයන්නේ 17වැනි සියවස දක්වා පමනි. ඊට පෙර ඓතිහාසික යුගයන්හි දී දේපල, වඩා පුලුල් මෙන් ම පොදු අර්ථයකින් පවා සාමාන්‍යයෙන් නිර්වචනය කෙරිනි. පයිප්ස් යොදාගන්නේ ආර්ථික ජීවිතයේ දී වෙලඳපොල සබඳතාවන් ආධිපත්‍ය දැරීමට පටන් ගත් පසුව පමනක් භාවිතයට පැමිනි නිර්වචනයකි. එම අවස්ථාවේ දී ප්‍රධාන කොට ම දේපල අවබෝධ කරගනු ලැබුවේ "දෙයකින් තෘප්තිය හෝ ප්‍රයෝජනය ලැබීම සඳහා අනෙකුත් අය ඉන් ඉවත් කර තැබීමට" පුද්ගලයකු සතු අයිතිය වසයෙනි.[20]

මානව වර්ගයා අතර ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කිරීම සාපේක්ෂකව මෑත වසරවල දී ආරම්භ කර ඇති මෙම දේපල ආකෘතිය - මෙසේ පැවසීම ප්‍රවේශම් සහගත යයි මම සිතමි - අඩු හෝ වැඩි වසයෙන් අවශේෂ තිරිසන් රාජධානිය තුල නොදැන සිටි දෙයකි! කෙසේ වුවත් සමාජවාදය යටතේ, ඔබගේ අයි-පොඩ්ස්, නිවාස, වාහන හා අනෙකුත් වටිනා කියන පුද්ගලික දේපලවලට කුමක් සිදු වේ දැයි ඔබ අතර කනස්සල්ලෙන් සිටින අයට සහතිකය වීමට මට ඉඩ දෙන්න. සමාජවාදය විසින් අහෝසි කිරීමට අපේක්ෂිත දේපල ආකෘතිය වනාහි නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතිය බව කීමට කැමැත්තෙමි.

මහාචාර්ය පයිප්ස්ගේ - සෝවියට් සංගමය බිඳ විසුරුවීමෙන් පසුව රචිත - වඩාත් මෑත කෘතීන්හි එක් සාධනීය ලක්ෂනයක් නම් මීට පෙර ඔහු ලිවූ සෝවියට් ඉතිහාසය පිලිබඳ පක්ෂවාදී වෙලුම හා ඔහුගේ දක්ෂිනාංශික න්‍යාය පත්‍රය අතර සම්බන්ධය ඉතා විවෘතව ඉදිරිපත් කිරීම ය. පයිප්ස්ට අනුව නම් ඔක්තෝබර් විප්ලවය හා සෝවියට් සංගමය නිර්මානය කිරීම නියෝජනය කලේ දේපල හා හිමිකාරත්වයේ වරප්‍රසාදවලට පහර දීමක් ය. එය බුද්ධි ප්‍රබෝධයේ අදහස්වල බිහිසුනු ඵලය වන සමාජ සමානතාව සඳහා

වූ ලෝකය පුරා ද, මහා පරිමානව ද, ශුද්ධ යුද්ධයක කූටප්‍රාප්තිය විය. එහෙත් ඉතිහාසයේ එම කාල පරිච්ඡේදය දැන් අවසානයකට පැමින තිබේ.

"හිම්කාරත්වයේ අයිතිවාසිකම් සමාජ සමානතාවය හා සාර්වත්‍රික ආර්ථික සුරක්ෂිතතාවය පිලිබඳ සාක්ෂාත් නොකලැකි අදහස් උදෙසා කැපකිරීම වෙනුවට ඒවා සමාජ සාරධර්ම දර්ශකයේ උචිත තැන යලි පිහිටුවීම අවශ්‍ය"යයි පයිප්ස් කියා සිටී. පයිප්ස් ඉල්ලා සිටින දේපල අයිතීන් යලි පිහිටුවීම නම් කුමක් ද? "ශුභසාධන රාජ්‍යය පිලිබඳ සමස්ත සංකල්පයට ම, එය 20 වැනි සියවසේ දෙවන භාගය තුල පරිනාමය වී ඇති ආකාරයට, පුද්ගල විමුක්තිය සමග එකට ගමන්කල නොහැකි ය.... එහි විවිධ 'හිම්කම්' ද, ව්‍යාජ 'අයිතිවාසිකම්' ද සමග ශුභසාධනය අහෝසිකර, 20 වැනි සියවසට පෙර ඒවාට කර ගැසූ, පවුලට හෝ පුද්ගලික පුන්‍යායතනවලට සමාජ ආධාර සැපයීමේ වගකීම් පැවරුවහොත් මෙම දුෂ්කරතාවය විසඳීම දෙසට තව බොහෝ දුරක් ගියා වනු ඇත." [21]

පාලක ප්‍රභූ පැලැන්තියට සෝවියට් සංගමයේ අවසානය දිස්වූයේ, ධනේශ්වර ආදී තන්ත්‍රය යලි පිහිටුවීමක් ලෙස ය; දේපල අයිතිය, ශ්‍රම සූරාකෑම, හා පුද්ගල ධන ඒකරාශීකරනය සියලු සීමාබන්ධනයන්ගෙන් මුදා ධනවාදයේ සූරාකන තන්ත්‍රය භූගෝලීයව ප්‍රකෘතිමත් වීමේ ආරම්භය ලෙස ය. සෝවියට් සංගමය බිඳ විසුරුවීමෙන් පසුව ගත වූ වසර 15ක පමන කාලය තුල ඇතිව තිබෙන සමාජ අසමානතාවයේ යෝධ වර්ධනය ද, ලෝක ජනගහනයේ පොහොසත්ම සියයට එක (විශේෂයෙන් ඉහලම සියයට 0.10) අත සංකේන්ද්‍රනය වී ඇති ධනයේ පරිමාව ද, කිසිසේත් ම අහම්බයක් නො වේ. මාක්ස්වාදයට හා සමාජවාදයට එරෙහිව ලොව පුරා එල්ල කෙරෙන ප්‍රහාරය, සාරය වසයෙන් මෙය ප්‍රතිගාමී හා ඓතිහාසිකව පරාභවික සමාජ ක්‍රියාවලියේ දෘෂ්ටිවාදී පිලිබිඹුවකි.

එහෙත් මෙම ක්‍රියාවලිය ප්‍රකාශනයක් සොයා ගන්නේ අන්ත දක්ෂිනාංශයේ ප්‍රතිමාක්ස්වාදී වාග් සංග්‍රාමය තුල පමනක් නො වේ. ධනේශ්වර සමාජයේ පොදු බුද්ධිමය කුනුවීම, වාම සුලුධනේශ්වරයේ නශ්ටාවශිෂ්ටයන් දක්ෂිනාංශයේ දෘෂ්ටිමය ප්‍රහාරය හමුවේ, අධෛර්මත්ව යටත්වීම තුල ද ප්‍රකාශිත වේ. ඔවුන්ගේ සුන් වූ බලාපොරොත්තු හා සිහින ලෝකයම කියා පාන්නා වූ කෙඳිරිගාන පැරනි රැඩිකලුන්ගේ පොත්වලින් ලෝකයේ පොත් සාප්පු පිරී පවති. අහන්නට කැමති ඕනෑම කෙනෙකුට තම බලාපොරොත්තු සුන් වීම ද, අධෛර්යමත් වීම, හා බෙලහීනත්වය ප්‍රකාශකර සිටීමෙන් ඔවුන් යම් ආකාරයක විකෘත වින්දනයක් ලබන බවක් පෙනී යයි. සැබැවින්ම සිය අසාර්ථකත්වයට තමන් ම වග කිවයුතු බව ඔවුන් සලකන්නේ ද නැත. නැත, සමාජවාදී විප්ලවය දෙන බවට පොරොන්දුවී එය ලබා නොදුන් මාක්ස්වාදය ට ඔවුන් ගොදුරු වූවා පමනි.

ඔවුන්ගේ පාපෝච්චාරනයෙහි මතක සටහන් ශෝචනීය වනවා පමනක් නොව, යම් ආකාරයකින් විසුලු ද වේ. සිය පෞද්ගලික ව්‍යසනයන්ට, යම් ලෝක ඓතිහාසික වැදගත්කමක් ආරෝපනය කිරීමට දඟලන ඔවුහු තමන්ම පරිහාසයට ලක් කර ගනිති. නිදසුනක් ලෙස, මහාචාර්ය රොනල්ඩ් ඇරොන්සන් " මාක්ස්වාදයෙන් පසු" යන සිය වෙලුම ආරම්භ කරන්නේ අමතක නොකලහැකි පහත සඳහන් වචනවලිනි:

"මාක්ස්වාදය අවසන් ය. අප තනිව සිටිමු. වමේ සිටි බොහෝ දෙනා හට, මැතක් වන තුරු තනි වී සිටීම සිතට නගාගත නොහැකි ව්‍යාධියක් - හසරක් නැතිවී ගිය සැටියක්, අනාත භාවයක් - විය. මාක්ස්වාදයේ අවසන් පරම්පරාව වන අපට ඉතිහාසය පවරා දී ඇත්තේ එය වලලා දැමීමේ අප්‍රසන්න කාර්යයි. [22]

මෙවන් අවසාන කෘත්‍ය භාරය අපේක්ෂා කලවුන් බොහෝ දෙනෙකුට පොදු තේමාවක් වූයේ සෝවියට් සංගමය බිඳ විසුරුවා ලීම ඔවුන්ගේ දේශපාලනික පමනක් නොව මානසික සමතුලිතතාවය ද බිඳ දමා තිබීම ය. ක්‍රෙම්ලින් නිලධරය ගැන ඔවුන්ගේ දේශපාලන විවේචන කවරක් වුව ද නිලධරයේ ප්‍රතිපත්තීන් සෝ.ස.ස.සං. විනාශ කිරීමට තුඩු දෙනු ඇතැයි ඔවුහු කවර කලෙකවත් නොසිතූහ. එනම් ඔවුන් ස්ටැලින්වාදය ප්‍රතිවිප්ලවවාදී යයි ට්‍රොට්ස්කි කල විශ්ලේෂනය කිසිවිටෙකත් පිලි නොගත් හ. එබැවින් ඇරොන්සන් මෙසේ පාපෝච්ඡාරනය කරයි.

"සෝවියට් සංගමයේ එම සෙලවී ගත නොහැකි බව හා සෙම්බර බව ම අපගේ සාමූහික මනස තුල සාර්ථක සමාජවාදයක් තවමත් මතු වීමට ඉඩ ඇතැයි යන අපගේ ජීවමාන බලාපොරොත්තු දල්වා ගැනීමට ඉඩ දෙමින් සාධනීය යමක් සේ ගනන් ගනු ලැබ තිබුනි. යම් වර්ගයක සාර්ථක සමාජවාදයක් පහලවේ ය යන්න ගැන කිසියම් අපේක්ෂාවක් ඉතුරු කර ගැනීමට ඉන් ඉඩ ලැබුනි. වෙනත් වර්ගයක මාක්ස්වාදය ශක්‍ය දැයි සලකා බැලීමට ද එය පසුකඩක් සේ ආධාරක විය. එහෙත් දැන් ඉතින් එය එසේ නො වේ. කොමියුනිස්ට්වාදයේ අභාවයෙන් එහි න්‍යායික හැකියාවන් බේරාගැනීමට අප කොතරම් උත්සාහ කලත් කාර්ල් මාක්ස්ගේ නම හා බැඳී තිබුනු, පරිවර්තනයේ හා අරගලයේ ලෝක මහා ඓතිහාසික ව්‍යාපෘතිය අවසන්ව ඇති බව පෙනී යයි. පශ්චාත් නූතනවාදීන් දන්නා පරිදි, මාක්ස්වාදය සමග ම සමස්ත ලෝක දෘෂ්ටියක්ම කඩා වැටී තිබේ. මාක්ස්වාදීන් හා සමාජවාදීන් පමනක් නොව, අනෙකුත් රැඩිකලුන් මෙන්

ම තමන් ප්‍රගතිශීලීන් හා ලිබරලුන් ලෙස සලකාගන්නවුන් ද දිසා හසරක් නැතිව සිටිති.[23]

පශ්චාත් යුද්ධ රැඩිකල් දේශපාලනයේ මහා විසාල පංගුවක කුඩා නීච රහස ඇරොන්සන් නොසිතාම මෙන් හෙලි කර ඇත. එනම් ස්ටැලින්වාදය සහ අනෙකුත් ප්‍රතිසංස්කරනවාදී කම්කරු නිලධරය මත ඔවුන් කොතරම් නම් ගැඹුරින් රැඳී සිටියේ ද යන්න යි. ඔවුන්ගේ මෙම රඳාපැවැත්මට පශ්චාත් දෙවන ලෝක යුද්ධ අවධියේ පන්ති හා දේශපාලන සබඳතාවන් තුල සංයුක්ත සමාජ පදනමක් පැවතුනේ ය. ඔවුන්ගේ ම පන්ති පරිසරයේ දේශපාලන හා සමාජ දුක්ගැනවිලිවලට වන්දි වසයෙන්, සුලුධනේශ්වරයේ සැලකියයුතු කොටස් බලවත් කම්කරු නිලධාරිතන්ත්‍රයන් විසින් හසුරුවන ලද සම්පත් මත බලාපොරොත්තු රැඳවූහ. මෙම නිලධාරි තන්ත්‍රයන්ගේ කොටසක් ලෙස හෝ, ඒ සමග සන්ධානගතව සිටි මෙම අසහනකාරී මධ්‍යමපන්තික රැඩිකලුන්ට පාලක පන්තිය වෙත සිය මිටමෙලවූ අත් උලුක්කරමින් සහන ලබා ගැනීමට හැකි විය. සෝවියට් තන්ත්‍රය බිඳවැටීමත් සමග ම වාගේ ලෝකය පුරාම ප්‍රතිසංස්කරනවාදී කම්කරු සංවිධාන කැඩී බිඳී යාමට පටන් ගත් අතර රැඩිකලුන් එ නමේ ම විශ්වාසය තබා සිටි නිලධාරිවාදී අනුග්‍රහය අහිමි කර දැමී ය. රැඩිකල් දේශපාලනයේ මෙම අසතුටට පත් හා තැතිගත් කොටස් ඒ ක්ෂනයේ ම අසරනභාවයට පත් විය.

මෙම ප්‍රවනතාවන් අතර අඩු හෝ වැඩි වසයෙන් සම්භාව්‍ය මාක්ස්වාදය කම්කරු පන්තිය වෙත පවරන ලද ඓතිහාසික ක්‍රියාකලාපය ඒ හැටියෙන් ම ගැනීම මාරාන්තික වැරැද්දක් ය. යන අදහස තිබුනි. වැඩිම තරමින් එක් වරක දී, අතීතයේ යම් සුරක්ෂිත අවස්ථාවක, එය යුක්තිසහගත වූ සමයක් පැවතුනේ යැයි පිලිගැනීමට ඔවුන් සූදානම්ව සිටියා විය හැකි ය. එහෙත් සත්තකින්ම දැන් එසේ නොවේ. "ධනවාදය තුල පමනක් නොව කම්කරු පන්තිය තුල ම පවා ඇතිව තිබෙන ව්‍යුහාත්මක පරිවර්තනයන් නිසා මාක්ස්ගේ ව්‍යාපෘතිය අවසානය යන තර්කයට ආධාර වන බොහෝ සාක්ෂි සැබැවින්ම පවතියි. මාක්ස්වාදයේ කේන්ද්‍රීය ප්‍රවර්ගය වන ශ්‍රමයේ තීරනාත්මක භාවද යන්න ධනවාදයේ ම පරිනාමය විසින් ප්‍රශ්නයට භාජනය කර තිබේ." යයි ඇරොන්සන් ප්‍රකාශ කරයි.

මෙය ලියා ඇත්තේ මාක්ස්ට හෝ එංගල්ස්ට සිතාගැනීමට වත් නොහැකි වූ මට්ටමකින්, ලෝක පරිමානව කම්කරු පන්තිය සූරාකෑම ක්‍රියාත්මක වන අවධියක යඃ මානව ශ්‍රම ශක්තියෙන් අතිරික්ත වටිනාකම් උපුටාගැනීමේ ක්‍රියාවලිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂනයේ විප්ලවය මගින් මහත්සේ තීව්‍ර කරනු ලැබ ඇත. සුලු ධනපති රැඩිකල්වාදී විචාරයේ එය ප්‍රමුඛ මාතෘකාවක් නොවන්නේවුවද ශ්‍රමය ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය තුල තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කරන්නේ ය. වැටුප් පහල දැමීමටත්, සමාජ ප්‍රතිලාභ කැපීමට හා අතුගා දැමීමටත් නිෂ්පාදනය කාර්යක්ෂම කිරීමටත් වැඩෙන නිර්දය භාවයකින් යුතු කුරිරු පීඩනයක් ඉතිහාසයේ නොවූ විරූ ආකාරයකින් එහි ක්‍රියාත්මක වේ.

"බලන්නේ නැති එවුන් තරම් අන්ධයන් තවත් ඇත්තේ නැත." ධනවාදයට විරුද්ධව විප්ලවීය අරගලයක් කිරීමට හැකි සැබෑ සමාජ බලවේගයක් නොපවතින්නේ නම් පවත්නා පර්යායට විකල්පයක් සිතාගැනීමට වත් හැක්කේ කෙසේ ද? මෙම උභතෝකෝටිකය සමකාලීන දේශපාලන අශුභවාදයේ ආකෘතියක් වන නව මනෝරාජිකවාදයේ අඩයාලමයි. සමාජවාදය විද්‍යාත්මක පදනමක තැබීමට මාක්ස් හා එංගල්ස් ගත් උත්සාහය, සමාජවාදී චින්තනයේ පූර්ව මාක්ස්වාදී හා මනෝරාජික අවධීන් යලි පනගැන්වීමට වෙර දරන, නව මනෝරාජිකවාදීන්ගේ විලාපයටත් හෙලා දැකීමටත් බඳුන්වෙයි.

නව මනෝරාජිකවාදීන් කියා සිටින්නේ සම්භාව්‍ය මාක්ස්වාදය 19 වැනි සියවසට ආවේනිකව නව වෛෂයික බලවේග ගවේෂනය පිලිබඳ යෙදීගැනීම ඕනැවට වඩා උකහාගත් බවයි. මෙම දැක්ම සමාජවාදී ව්‍යාපාරය කම්කරු පන්තිය හා එහි දේශපාලන අධ්‍යාපනයට ම යෙදී ගැනීමට පාදක විය. මාක්ස්වාදීහු, කම්කරු පන්තියේ විප්ලවවාදී විභවය ගැන පමනක් නොව, ධනේශ්වර ප්‍රතිවිරෝධයන්ගේ වෛෂයික බලය මත ද පිලිගත නොහැකි හා ඕනැවට වැඩි විශ්වාසයක් තබා ඇතැයි නව මනෝරාජිකවාදීහු ප්‍රකාශ කරති. තව ද අතාර්කිකබවේ බලය හා ඒත්තු ගැන්වීමේ ශක්තිය ද ඇගයීමට මාක්ස්වාදීන් අසමත් වූහ යි ද ඔවුහු කියා සිටිති.

උත්තේජනයේ හා උනන්දු කිරීමේ හැකියාවෙන් යුත් "මිථ්‍යා ප්‍රබන්ධ " වැලඳගැනීම හා ප්‍රචාරය කිරීම මගින්, මෙම උභතෝකෝටිකයෙන් ගොඩයාමේ මගක් සොයාගත හැකි බව නව මනෝරාජිකවාදීහු ප්‍රකාශ කරති. එවන් ප්‍රබන්ධයන් කවර වෛෂයික යථාර්ථයකට අනුරූප වන්නේ ද යන්න සැබැවින්ම ඔවුන්ට වැදගත් නො වේ. මිථ්‍යා ප්‍රබන්ධනයේ ප්‍රමුඛ නව මනෝරාජික ප්‍රකාශකයකු වන වින්සන්ට් ජියෝහෙගන් " මනෝවිද්‍යාවක් වර්ධනය කිරීමට අසමත් වී" තිබීම ගැන මාක්ස් හා එංගල්ස්ව විවේචනය කරයි. "මානව අභිප්‍රේරනයේ සංකීර්නතාවන් ගැන ඔවුන් ඉතිරි කර ඇත්තේ ඉතා අල්ප දායාදයක් වන අතර ඔවුන්ගේ ආසන්නතම අනුප්‍රාප්තිකයෝ මෙම ඌනතාවය ජයගැනීමේ අවශ්‍යතාවය සුලුකොට තකති."[25] සමාජවාදීන් නොව අන්ත දක්ෂිනාංශිකයන් විශේෂයෙන් ම නාසින්, ප්‍රබන්ධයන්ගේ ශක්තිය හා ඒවායේ ප්‍රකාශනය වටහා ගත් බව ජියෝහෙගන් පැමිනිලි කරයි. "දහස් වසරක රයිකයක් (ජර්මානු ජාතික සමූහාන්ඩුක) දෘෂ්ටියක් නිර්මානය කිරීමට නාසීන් සමත්වූයේ, වික්‍රමාන්විත සංකල්පයක් ටියුටොනික්

ජර්මානු සම්භවයක් සහිත නයිට්වරුන්, සැක්සන් රජවරුන්, හා "ඒ ලෙයෙහි ම" අද්භූත පෙලඹවීම මගින්, ජාතික සමාජවාදීන් ය" "වාමාංශිකයේ ප්‍රතිගාමිත්වයට ආයාචනා කරන ප්‍රතිගාමිත්වය පිලිබඳව කොඳුරමින් කල්තියා ම එය අතහැර දැමූහ." [26]

අතර්කයට කෙරෙන මෙම නින්දිත ආයාචනය එහි ගැඹුරු ප්‍රතිගාමී දේශපාලන ඇඟවීම් ද සමග ගලා එන්නේ, සමාජවාදී විප්ලවය සඳහා වෛෂයික පදනමක් නොමැත්තේ ය. යන අපේක්ෂා භංග දෘෂ්ටියේ විකෘත තර්කනයකිනි.

මාක්ස්වාදයේ සමාජවාදයේ හා සත්තකින්ම, කම්කරු පන්තියේ අසාර්ථකත්වය ගැන මේ අසාරදර්ශනයේ විලාප ගීත අතර අපට සොයා ගත නොහැකි දෙය වන්නේ, විසිවන ශතවර්ෂයේ ඉතිහාසය ගැන මොනයම්මැ හෝ සංයුක්ත ඓතිහාසික විභාග කිරීමක් හෝ විසිවන ශතවර්ෂයේ විප්ලවවාදී ව්‍යාපාරයේ ජයග්‍රහනයන්ට හා පරාජයන්ට හේතු වූ සිද්ධි, පක්ෂ හා වැඩ පිලිවෙලවල්, ගැන නිරවද්‍ය අධ්‍යයනයක් පාදක කොට ගෙන නිරාවරනය කිරීමට දරන උත්සාහයකි. මනෝරාජ්‍යවාදයේ තේමාවට කැප කල 'සෝශලිස්ට් රෙජිස්ටර්' සඟරාවේ 2000 වසර සංස්කරනයෙන් අපට දන්වා ඇත්තේ "මාක්ස්වාදයට නව සංකල්පමය ස්ථරයක්, කලින් තිබුනේ නැති වූ හෝ සංවර්ධනය නොවූ මානයක්"[27] අත්‍යවශ්‍යව ඇති බවයි. අවශ්‍යව ඇති අවශ්‍ය නොවන ම දෙය එයයි. ඊට ප්‍රතිකූල ලෙස අවශ්‍යව ඇත්තේ 20 සියවස අධ්‍යයනය කිරීමේ දී අපෝහක හා ඓතිහාසික භෞතිකවාදී විධික්‍රමය යොදා ගැනීමයි.

**මතුසම්බන්ධයි**

**සටහන් -**

[14] Preface to *Max Weber and Karl Marx* (මැක්ස් වෙබර් හා කාර්ල් මාක්ස්ට පෙරවදනක්) කාල් ලෝවිත් (නිව් යෝර්ක් හා ලංඩන් 1993) පිටු 5.

[15] *Interesting Times* (ආශ්වාදජනක වේලාවන්) නිව් යෝර්ක් 2002, පි.127

[16] New York, (නිව් යෝර්ක්) 2000, පි.3.

[17] *Marxism and the Leap to the Kingdom of Freedom—The Rise and Fall of the Communist Utopia* (මාක්ස්වාදය හා නිදහසේ රාජධානියට පිම්ම - කොමියුනිස්ට් මනෝරාජ්‍යයේ නැගීම හා වැටීම) ස්ටැම්ෆර්ඩ් 1995, පි. 225.

[18] ms' 225'

[19] New York, 2000, (නිව් යෝර්ක්) 2000, පි.286.

[20] C. B. Macpherson, *The Rise and Fall of Economic Justice* (ආර්ථික යුක්තියේ නැගීම හා වැටීම), සී. බී. මැක්ෆියර්සන්, ඔක්ස්ෆර්ඩ් 1987 - පි.77.

[21] එම - පිටු 284-88.

[22] New York, 1995. (නිව් යෝර්ක්) 1995, පි.1.

[23] එම - පිටු vii-viii.

[24] එම - පිටු 56.

[25] *Utopianism and Marxism* (යුතෝපියානුවාදය හා මාක්ස්වාදය) නිව් යෝර්ක් - 1987, පි.68.

[26] එම - පිටු 72.

[27] *Necessary and Unnecessary Utopias* (අවශ්‍ය හා අනවශ්‍ය යුතෝපියාවන්) සෆෝල්ක් 1999, පි.22.

© www.wsws.org